# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,074 - 2018 ජූනි මස 01 වැනි සිකුරාදා - 2018.06.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 982 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 982 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - (i) බද්ධ නිවාස අයිතිකම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත 2018 මැයි මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත 2018 මැයි මස 25 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 ජූනි මස 22 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 ජූනි මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


981 - B 81287 — 5,403 (2018/06)
F 1 -

# පළාත් සභා නිවේදන

**ප්‍රධාන ලේකම් කාර්යාලය - වයඹ පළාත**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධි විධාන) පනත සමඟ කියැවෙන 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමූපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධනය වූ 1972 අංක 05 දරන සමූපකාර සමිති පනතේ 2(2) උප වගන්තිය යටතේ විශේෂ ආඥාවක් අනුව සිදු කරන බලය පැවරීම.

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධි විධාන) පනත සමඟ කියැවෙන 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමූපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධනයවූ 1972 අංක 05 දරන සමූපකාර සමිති පනතේ 2 (2) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව වයඹ පළාත් සභාවේ සමූපකාර සංවර්ධන හා වෙළඳ ඉඩම්, විදුලිබල හා බල ශක්ති, ක්‍රීඩා හා යෞවන කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍ය පියසිරි රාමනායක වන මම වයඹ පළාතේ සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ රෙජිස්ට්‍රාර්ට සහය වීමට පත්කර ඇත්තාවූ මීට අමුණා ඇති උපලේඛනයේ 1 තීරුවේ සඳහන් අයට 1983 අංක 32 හා 1992 අංක 11 දරන සමූපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධිතවූ 1972 අංක 05 දරන සමූපකාර සමිති පනත හා ඒ යටතේ පනවා ඇති රීති මාලාව යටතේ සමූපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් වෙත පැවරී ඇත්තාවූ එකී උපලේඛනයේ 111 තීරුවෙහි සඳහන් සියළුම බලතල එකී උපලේඛනයේ 11 වැනි තීරුවෙහි සඳහන් දින සිට මෙයින් පවරමි.

පියසිරි රාමනායක,
පළාත් අමාත්‍ය,
සමූපකාර සංවර්ධන හා වෙළඳ ඉඩම්, විදුලිබල හා බල ශක්ති,
ක්‍රීඩා හා යෞවන කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු සහ
තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය (වයඹ පළාත).

2018 අප්‍රේල් මස 25 වැනි දින,
කුරුණෑගලදී ය.

උපලේඛනය

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| 01. හෙන්රි දසනායකගේ රංජනී විමලසූරිය<br>02. කීනගහවත්තේ ගෙදර බණ්ඩාර මැණිකේ | 2018.02.14 | සමූපකාර සමිති පනතේ 3, 5, 6, 7, 8, 9, 33, 39, 44 [44(6), 45, 46, 48, 49, 50, 52, 53, 54, 58 [58(3) සහ 58 (5) හැර] 59, 68 සහ 72 යන වගන්ති යටතේ කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් වරයාගේ සියලු බලතල රීති මාලාවේ 4, 11, 15, 16 (II), 18, 19, 27, 32, 33, 35, 37, 39, 40, 41, 42, 43, 48, 49 [49(XII) හැර] 51, 52 සහ 53 දරන රීති යටතේ කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් වරයාගේ සියලු බලතල. |

06-304

---

# තනතුරු - ඇබෑර්තු

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් ආදායම් සේවයේ පළාත් ආදායම් කොමසාරිස් තනතුර සඳහා බඳවා ගැනීම - 2018**

**(විධායක නිලධාරි සේවා ගණය 1 ශ්‍රේණිය)**

01. වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියමය පරිදි වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ පළාත් කොමසාරිස් තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *තනතුරු නාමය* : පළාත් ආදායම් කොමසාරිස් (විධායක නිලධාරි සේවා ගණය 1 ශ්‍රේණිය)

*03. සේවා කොන්දේසි :*

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

II. රාජ්‍ය සේවයේ තනතුරුවලට බඳවා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ I වන කොටසේ II 'අ' කොටසේ ඇතුලත් පොදු කොන්දේසිවලට යටත් විය යුතු ය.

04. වැටුප් කාණ්ඩය හා වැටුප් පරිමාණය : SL 1-2016
රු. 47,615 - 10x1335 - 8x1630 - 17x2170 - රු. 110,895 එසේ වුවත්, රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 3/2016 විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන IIහි පරිදි වැටුප ගෙවනු ලැබේ.

05. *සුදුසුකම් :*

1. ඉල්ලුම්පත් කැඳවන අවසාන දිනට වයඹ පළාත් සභාවේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් කිසියම් පළාත් සභාවක හෝ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවක හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ - ආදායම් සේවයට බැඳී වසර 20 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

*සහ*

විධායක නිලධාරි ගණයේ (1 වන ශ්‍රේණියේ) අවම වශයෙන් වසර 03 ක සක්‍රීය සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

2. ඉල්ලුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්නයෙන් වසර 05 ක සක්‍රීය සතුටු දායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

06. *බඳවා ගැනීමේ ක්‍රමය :*

පත්වීම් බලධරයා විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශය මත අයදුම්කරුවන් අතරින් සුදුසු නිලධාරියෙකු පළාත් ආදායම් කොමසාරිස් තනතුරට බඳවා ගනු ලැබේ.

07. *සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීමේ ක්‍රමවේදය :*

| *අනු අංකය* | *නිර්ණායක* | *ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01 | ආදායම් සේවයේ නිලධාරියෙකු වශයෙන් සේවය කර ඇති එක් වසරක කාලයක් සඳහා ලකුණු 02 බැගින් වසර 20 ක් සඳහා | ලකුණු 40 |
| 02 | *අධ්‍යාපන සුදුසුකම් :*<br>I. උපාධියක් සඳහා | ලකුණු 05 |
| | II. පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සදහා (විෂයට අදාලව) | ලකුණු 10 |
| | III. පශ්චාත් උපාධියක් සඳහා (විෂයට අදාලව) | ලකුණු 15 |
| | (ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) | |
| | IV. ඉංග්‍රීසි භාෂාව සඳහා මාස 06 කට නොඅඩු ඩිප්ලෝමාවක් සඳහා | ලකුණු 10 |
| | (අධ්‍යාපන සුදුසුකම් මත ලබා දෙන උපරිම ලකුණු සංඛ්‍යාව 25 කි.) | |
| 03 | පරිගණක හැකියාව | ලකුණු 05 |
| 04 | වයඹ පළාත් සභාවේ ආදායම් සේවයේ කර ඇති සේවා කාලය වෙනුවෙන් අයදුම්පත් කැඳවන දිනට එක් පූර්ණ වසරක් සඳහා ලකුණු 01 බැගින් උපරිම ලකුණු 10 | ලකුණු 10 |
| 05 | ආදායම් සේවාවේ කර ඇති විශේෂ ව්‍යාපෘති සඳහා ලිඛිත ලේඛන එකකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 10 | ලකුණු 10 |
| 06 | ඉදිරිපත් වීමේ හැකියාව හා පෞරුෂය සඳහා | ලකුණු 10 |
| | මුළු ලකුණු සංඛ්‍යාව | ලකුණු 100 |

09. *අයදුම් කළ යුතු ආකාරය :*

ආදර්ශ ආකෘතිය ප්‍රකාර සකස් කර ගන්නා ඉල්ලුම් පත 2018.06.22 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ වයඹ ආණ්ඩුකාරවර ලේකම්, වයඹ පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය, මාළිගාව, කුරුණෑගල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ "වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ පළාත් ආදායම් කොමසාරිස් තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කළ යුතු ය. අයදුම්පත සමග පත්වීම් ලිපියේ හා විධායක නිලධාරි සේවා ගණය 1 ශ්‍රේණියට උසස්වීම් ලද ලිපියේ සහතික කළ පිටපතක් එවිය යුතු ය.

10. අසම්පූර්ණ හා අවිධිමත් ඉල්ලුම්පත්‍ර කිසිම දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගය පරිදි,

එන්. පී. එම්. කාරියවසම්,
වයඹ ආණ්ඩුකාරවර ලේකම්.

2018 ජුනි මස 01 වැනි දින,
වයඹ පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය,
මාළිගාව,
කුරුණෑගල.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**වයඹ පළාත් සහා රාජ්‍ය සේවයේ පළාත් ආදායම් සේවයේ පළාත් ආදායම් කොමසාරිස් තනතුර සඳහා බඳවා ගැනීම - 2018**
**(විධායක නිලධාරි සේවා ගණය 1 ශ්‍රේණිය)**

01. නිලධාරියාගේ නම :

I. මුලකුරු සමග නම :.......................................................................................................................................

II. මුලකුරුවලින් හැඳින්වෙන නම :....................................................................................................................

02. ලිපිනය :

I. කාර්යාලීය ලිපිනය :....................................................................................................................................

II. පුද්ගලික ලිපිනය :......................................................................................................................................

03. දුරකථන අංකය :

I. රාජකාරි :.........................................................................

II. පෞද්ගලික :.................................................................. ජංගම :............................................................

04. උපන් දිනය :......................................................... 2018.06.22 දිනට වයස : අවු. :.................., මාස :.................., දින :.....................,

05. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

06. ස්ත්‍රී/පුරුෂ භාවය :.....................................

07. පළාත්/දේශීය ආදායම් සේවයට පත් වූ දිනය :................................................

08. දැනට දරන තනතුර :.......................................................................................................................................

එම තනතුරට පත්කළ දිනය :.....................................

09. එම තනතුරේ සේවා කාලය :.......................................

10. තම සේවා කාලය තුළ කුමන හෝ අවස්ථාවක තමාට විරුද්ධව විනයානුකූල පියවර ගෙන තිබේ ද? :.............................. එසේ නම් ඒ පිළිබඳ විස්තර :..........................................................................................................................................................

මා විසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බැව් සහතික කරමි.

..........................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :............................................

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

ඉහත තොරතුරු සඳහන් ........................................................................................................ මයා/මිය ............................................................ . කාර්යාලයේ සේවය කරන බව ද ඔහු/ඇය ගේ සේවය සතුටුදායක බව ද, මෙම තනතුර සඳහා ඔහු හෝ ඇය තෝරාගනු ලැබුව හොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් මුදා හැරිය හැකි බව ද සහතික කරමි.

..................................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :............................................

06-203

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
# සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල රු. ශ. | තැපැල් ගාස්තුව රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2018 වර්ෂය** | | | |
| **ජුනි** | 2018.06.01 | සිකුරාදා | 2018.05.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.06.08 | සිකුරාදා | 2018.05.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.06.14 | බ්‍රහස්පතින්දා | 2018.06.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.06.22 | සිකුරාදා | 2018.06.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.06.29 | සිකුරාදා | 2018.06.14 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| **ජූලි** | 2018.07.06 | සිකුරාදා | 2018.06.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.07.13 | සිකුරාදා | 2018.06.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.07.20 | සිකුරාදා | 2018.07.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.07.26 | බ්‍රහස්පතින්දා | 2018.07.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අගෝස්තු** | 2018.08.03 | සිකුරාදා | 2018.07.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.08.10 | සිකුරාදා | 2018.07.26 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2018.08.17 | සිකුරාදා | 2018.08.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.08.24 | සිකුරාදා | 2018.08.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.08.31 | සිකුරාදා | 2018.08.17 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.).*

2018 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.